# රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය අකර්මන්‍ය කිරීමට හේතු වූ නඩුවෙන් පනවා තිබූ වාරණ නියෝගය ඉවත් කිරීම.

## පසුබිම

- රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ 31ක් වූ මුළු තනතුරු සංඛ්‍යාවෙන් 26ක් නිතරඟයෙන්තේරී පත් වී තිබුණි. එහෙයින් නිලවරණය පැවැත්වීමට තිබුනේ තනතුරු 5ක් සඳහා පමණි.
- කොළඹ දිසා අධිකරණයේදී වෛද්‍ය නිරෝෂන් මහතාගේ කණ්ඩායම සමග එකට තරඟ කල වෛද්‍ය අනිල් අඹවත්ත සහ වෛද්‍ය තුසිත පෙරේරා යන දෙදෙනා විසින් ගොනු කරන ලද DSP 138/14 දරණ නඩුව මඟින් වෛද්‍ය හර්ෂ අතපත්තු මහතා උප සභාපති තනතුර වෙනුවෙන් තරඟ කිරීම අත්හිටුවන ලදී.
- කොළඹ සිවිල් අභියාචනා මහාධිකරණයේ අංක: WP/HCCA/COL/78/14 LA දරණ නඩුවේදී මේ සම්බන්ධයෙන් 2014.06.27 එළැඹෙනු ලැබූ එකඟතාවය අනුව උප සභාපති තනතුරු දෙක හැර සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික තනතුරු සඳහා පමණක් 2014.06.28 වන දින ඡන්දය පැවැත්විණි.
- එහෙත් තැපැල් ඡන්ද පත්‍රිකා ඒ වන විටත් මුද්‍රණය කර, ඡන්දදායකයින් හට තැපැල් කර තිබීම නිසා උප සභාපති ධූර අපේක්ෂකයින්ගේ නම් ඒවායේ සටහන් වී තිබුණි. නමුත් එම උප සභාපති තනතුරු සඳහා ඡන්ද ගණන් නොකළ හෙයින් ඉන් සමස්ථ ඡන්ද ක්‍රියාවලියට හෝ එහි ප්‍රතිඵලයට බාධාවක් සිදු නොවීය.
- මේ වන විට වෛද්‍ය නිරෝෂන් ප්‍රේමරත්න මහතා ඇතුළු පස් දෙනෙකුගෙන් යුත් පිරිසක් විසින් ගල්කිස්ස දිසා අධිකරණය වෙත අංක: 1335/14/SPL දරණ නඩුව ගොනු කර, ඒ හරහා ජූනි 25 වැනිදා, වාරණ නියෝගයක් ලබා ගෙන තිබුණි. විශේෂ කරුණ නම් 27 වන දා මේ එකඟතාවයට එළැඹෙන විට 25 වනදා වාරණයක් ලබාගත් බව රහසක්ව තබා ගැනීමයි. නිලවරණයෙන් පසුව වෛද්‍ය නිරෝෂන් ප්‍රේමරත්න මහතා ඇතුළු පිරිස විසින්ම ගල්කිස්ස දිසා අධිකරණයේ අංක: 1337/14/SPL දරණ නඩුව ගොනු කර, නිලවරණය පැවැත්වීම තුලින් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ නිලවරණ කමිටුවත්, වෛද්‍ය පාදෙණිය මහතාත් විසින් අධිකරණයට අපහාස කල බවට ප්‍රකාශ කර සිටියහ. ඒ නිසා ඔවුනට එරෙහිව දඬුවම් පමුණුවන ලෙසද ඔවුහු වැඩිදුරටත් ඉල්ලා සිටියහ.
- අනතුරුව මෙම කණ්ඩායමට සහය දැක්වීම සඳහා වෛද්‍ය ලලන්ත රණසිංහ සහ වෛද්‍ය නිමල් රත්නසේන යන මහත්වරුන් ඉදිරිපත් වූ අතර රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය නියෝජනය කරන්නේ ඔවුන් දෙදෙනා බව පවසා, වෛද්‍ය නිරෝෂන් ප්‍රේමරත්න මහතාගේ චෝදනාවට සහය දැක්වීමට කටයුතු කලහ.

## අංක: 1337/14/SPL දරණ අඩංගු කරුණු

### මෙම නඩු හතර වෙන වෙනම නඩු නොවේ

- ගල්කිස්ස දිසා අධිකරණයේ අංක: 1335/14/SPL සහ අංක: 1337/14/SPL දරණ නඩු, කොළඹ දිසා අධිකරණයේ අංක: DSP 138/14 දරණ නඩුවට සහ කොළඹ සිවිල් අභියාචනා මහාධිකරණයේ අංක: WP/HCCA/COL/78/14 LA දරණ නඩුවට සෘජුවම අදාළ වේ. ( පිටු අංක 12).
- කොළඹ දිසා අධිකරණයේ අංක: DSP 138/14 දරණ නඩුව සඳහා මෙම තොරතුරු ඉදිරිපත් කල හැකිව තිබියදී, ගල්කිස්ස දිසා අධිකරණය හමුවේ අංක: 1335/14/SPL සහ අංක: 1337/14/SPL දරණ නඩු දෙකම පැවරීමට පැමිණිලිකරුවන් කටයුතු කර ඇත. ( පිටු අංක 13).

### මැතිවරණ කමිටුවේ තීරණය සාධාරණද?

කොළඹ දිසා අධිකරණයේ අංක: DSP 138/14 දරණ නඩුවේ තීන්දුව අනුව, වෛද්‍ය හර්ෂ අතපත්තු මහතාගේ නම ඇතුලත් කිරීම වාරණය කිරීම නිසා ඔහුගේ නම නොමැතිව සහ/හෝ ඔහුගේ නම ඇතුලත් ඡන්ද පත්‍රිකා ගණන් කිරීමෙන් තොරව 2014/2015 වර්ෂයන් සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ නිලවරණයක් පැවැත්වීම යුක්ති සහගත සහ සාධාරණ වේ.

මෙම ඡන්දය කොළඹ සිවිල් අභියාචනා මහාධිකරණයේ අංක: WP/HCCA/COL/78/14 LA දරණ නඩුවේදී පාර්ශවයන් අතර ඇති කරගන්නා ලද එකඟතාවයට ද අනුකූල වේ. ( පිටු අංක 10/11 ).

### මැතිවරණ කමිටුව වාරණ නියෝගය උල්ලංඝනය කර තිබේද?

ගරු සිවිල් අභියාචනාධිකරණය වැනි ඉහල අධිකරණයක් ඉදිරියේ එකම සිද්ධියක් සම්බන්ධයෙන් එකඟතාවයක් ඇතිකරගෙන තිබියදී ඊට පටහැනි ලෙස මෙම අධිකරණයෙන් නිකුත් කර ඇති වාරණ ආඥාවක් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට භාර දී ඇති විටෙක, එවැනි ආඥාවක් සම්බන්ධයෙන් සාධාරණ බුද්ධිමත් අයෙකුට නිශ්චිත නිගමනයකට එළඹිය නොහැක.

ඒ අනුව අංක: 1335/14/SPL දරණ නඩුවේ වාරණ ආඥාව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් නිශ්චිතවම උල්ලංඝනය කර ඇති බවට සාක්ෂි ඉදිරිපත් වී නැත. ( පිටු අංක 14/15/16).

## මෙම නිලවරණය නීති විරෝධීද?

වාරණ නියෝගය උල්ලංඝනය කල බවට සාක්ෂි ඉදිරිපත් වී නොතිබුන බව අධිකරණය තීරණය කර ඇත. එමෙන්ම නිලවරණයක් නොපවත්වන ලෙසට කරන ලද වාරණ නියෝගයක් උල්ලංඝනය කල පමණින් එම නිලවරණය නීති විරෝධී හෝ බල රහිත බවට අධිකරණයකින් ප්‍රකාශයක් කල නොහැක. ( පිටු අංක 17 ).

## ගල්කිස්ස අධිකරණයේ නඩුව පැවරීම නිවැරදි නැත

මෙම නඩුව එහි විත්තිකරුවන් පදිංචිව සිටින ප්‍රදේශයේ අධිකරණයක පැවරිය හැකි බවට නිගමනය කිරීමෙන් පසුව වුවත්, ඔවුන්ගේ පදිංචිය ඇත්තේ නුගේගොඩ අධිකරණ බල ප්‍රදේශයේ හෙයින් මෙම නඩුව පැවරිය යුතුව තිබුණේ නුගේගොඩ දිසා අධිකරණයේ බව පැහැදිලි වේ. ( පිටු අංක 23).

## ඡන්ද දායකයින්ගේ අයිතිය

ඡන්ද 2600 කට වඩා ලබා ගෙන සිටින වෛද්‍ය පාදෙණිය මහතා ඇතුළු පිරිසට, ඔවුන්ට අනුරූප ධූරයන්හි කටයුතු කිරීමට ඉඩ නොදෙමින් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ කටයුතු සහ එකී ඡන්ද දායකයින්ගේ එදිනෙදා කටයුතු වලටද මෙන්ම එහි ඡන්දදායක වෛද්‍යවරුන්හටද අගතියක් සිදුවන බව පෙනී යයි. ඡන්ද 140ක් වැනි ප්‍රමාණයක් ලැබීම නිසා **තේරී පත් නොවූ** වෛද්‍ය නිරෝෂන් ප්‍රේමරත්න සහ රුවිර සරණපාල යන මහත්වරුන්ට වාරණ ආඥාව ක්‍රියාත්මක නොවීමෙන් විශේෂ පාඩුවක්ද සිදු නොවේ. ( පිටු අංක 25/27 ).

## අතුරු පාලක මණ්ඩලයක් පත් කල හැක්කේ කවර අවස්ථාවකදීද?

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ව්‍යවස්ථාවට අනුව අතුරු කමිටුවක් පත් කල හැක්කේ විධායක කමිටුවක්, වාර්ෂික නිලවරණයෙන් තේරී පත් නොවූ විට පමණි. **2014.06.28 දින නිලවරණය නීති විරෝධී බවට කරුණු ඉදිරිපත් නොවූ නිසා, එම තේරී පත් වූ නිලධාරීන්ට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වෙනුවෙන් කටයුතු සිදු කල හැකි බැවින් අතුරු කමිටුවක් පත්කර ගැනීමේ අවශ්‍යතාවයක් ද නැත.** ( පිටු අංක 27).

## රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වෙනුවෙන් උසාවියට ඉදිරිපත් විය හැක්කේ කාටද?

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ මධ්‍යම කාරක සභාව මගින් වෛද්‍ය ලලන්ත රණසිංහ සහ වෛද්‍ය නිමල් රත්නසේන යන භාරකරුවන් දෙදෙනාට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය නියෝජනය නොකරන ලෙස නියෝග කර ඇත. එමෙන්ම අනෙක් භාරකරුවන් තිදෙනා වන, වෛද්‍ය පබා පලිහවඩන, වෛද්‍ය සමන් අබේවර්ධන, වෛද්‍ය ප්‍රසන්න දසනායක යන අයට සංගමය වෙනුවෙන් ඉදිරිපත් වන ලෙසද ඉල්ලා ඇත.

එසේම රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සාමාන්‍ය පරිපාලනය, මධ්‍යම කාරක සභාවට පැවරී ඇති හෙයින් එම කමිටුවේ නියෝග වලට පරිභාහිරව කටයුතු කිරීමට එහි භාරකරුවන් හට නීත්‍යානුකූල හිමිකමක් නැත. එහෙයින් වෛද්‍ය ලලන්ත රණසිංහ සහ වෛද්‍ය නිමල් රත්නසේන යන මහත්වරුන් හට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වෙනුවෙන් ඉදිරිපත් විය නොහැක. ( පිටු අංක 30/31/32).

## පැමිණිල්ල විසින් අධිකරණ ක්‍රියාවලිය අනිසි ලෙස යොදාගෙන ඇත

වෛද්‍ය නිරෝෂන් ඇතුළු පිරිස විසින් සමස්තයක් ලෙස අධිකරණ ක්‍රියාවලිය අනිසිලෙස යොදාගෙන ඇති බව මෙම නඩුවේ නියෝගයෙහි පැහැදිලිව දක්වා ඇත. ( පිටු අංක 23).

## වාරණය දිගු කල යුතුද?

මේ සියල්ල අනුව පැමිණිල්ලෙන් ඉල්ලා ඇති වාරණ ආඥාව දීර්ඝ කිරීමට පැමිණිල්ලට නීත්‍යානුකූල හැකියාවක් නොමැත. ඒ අනුව බැලූ බැල්මට නඩුවක් ලෙස හැඳින්විය හැකි යමක් පැමිණිල්ල විසින් මෙම නඩුවේදී ඉදිරිපත් කර නැත. එහෙයින් දැනට නිකුත් කර ඇති වාරණ ආඥාව අත්හිටුවීමට/විසිරුවා හැරීමට තීරණය කෙරිණි. ( පිටු අංක 28).

# විධායක කමිටුව වාරණය වූ පමණින් මධ්‍යම කාරක සභාව බල රහිත නොවන බව ඉහත අධිකරණ තීන්දුව මගින් පැහැදිලි වේ.

**මේ නඩුවේදී රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වෙනුවෙන් පහත සඳහන් නීතිඥවරුන් ඉදිරිපත් වී ඇත:**
**නීතිඥ රොමේෂ් ද සිල්වා, නීතිඥ N. R. සිවේන්ද්‍රන්, නීතිඥ සුගත් කල්දේරා , නීතිඥ රවීන්ද්‍රනාත් දාබරේ , නීතිඥ S. D. අරුල්ප්‍රගාසම්, නීතිඥ G. G. අරුල්ප්‍රගාසම්**

**රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය**